# නර්තනය - II ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

# තුන් තිතේ ප්‍රභේද

**හැඳින්වීම.**

දේශීය තාල ශාස්ත්‍රයේ තනි තිත, දෙතිත, තුන්තිත ආදී වශයෙන් විවිධ තිත් රූප ගොඩනැගී ඇත. තනි තිත වශයෙන්

01. සුළු තනි තිත (මාත්‍රා 2 තනි තිත)

02. මැදුම් තනි තිත (මාත්‍රා 3 තනි තිත)

03. මහ තනි තිත (මාත්‍රා 4 තනි තිත) ලෙස ද,

දෙතිත වශයෙන් තනි තිත් දෙකක් එකතු වී දෙතිතේ තාල රූප සාදයි. එනම්,

01. සුළු මැදුම් දෙතිත (මාත්‍රා 2+3 තාලය)

02. සුළු මහ දෙතිත (මාත්‍රා 2+4 තාලය)

03. මැදුම් මහ දෙතිත (3+4 තාලය) වශයෙනි.

තිත් රූප 3 ක් එකතු වීමෙන් තුන් තිතේ තාල රූප සෑදී ඇත. ඒ අනුව තුන් තිතේ ප්‍රචලිත තිත් ප්‍රභේද 2 ක් හඳුන්වා දිය හැකිය.

තුන් තිතේ ප්‍රචලිත තිත් ප්‍රභේද

දෙසුළු මැදුම් තුන් තිත (මාත්‍රා 2+2+3)

දෙසුළු මහ තුන් තිත (මාත්‍රා 2+2+4)

තුන් තිතේ තාල රූප ප්‍රස්තාරකරණයේ දී භාවිත කරන සංකේත වන (^) - තිත් යන තාල සංකේතයද, (/) - තෙයි යන සංකේතයද එකතු වීම නිසා තිත් තිත් තෙයි (^ ^ /) යනුවෙන් භාවිත කෙරේ.

```
  ^             ^             /
|1        2|1        2|1        2        3|
```

## දෙසුළු මැදුම් තුන් තිත තාලය

**(මාත්‍රා 2+2+3)**

තුන් තිතේ තිත් ප්‍රභේදයෙහි ඉහත සඳහන් කර ඇති ආකාරයට ආඝාතය තැබීම සංකේතවත් කෙරේ. මෙහිදී තාලම්පොට සංවෘතව දෙවරක් වාදනය වන අතර විවෘතව එක් වරක් වාදනය කෙරේ.

උදාහරණ :- ^ තිත් ^ තිත් / තෙයි

| | ^ 1 2 | ^ 1 2 | / 1 2 3 | ^ 1 2 | ^ 1 2 | / 1 2 3 |
|---|---|---|---|---|---|---|
| උඩරට | දොම් තකු | දොම් තකු | දොං ජං - | ගත් - | තත් - | ජිං තරි කිට |
| පහතරට | දිත් - | තම් - | දි ත ම් | දොං - | දොං - | තා - ම් |
| සබරගමු | තත් - | කි ට | ත ක ට | ජි ම් | ත් කු | දා |

පැවිය ගනඳුරු දුරැර දිවාකර

ලීලය රන්පැහැ සිරිවස ගෙන දර

මේ වන දුක් දුරලන්ට පෙමා කර

සූරිය දෙව්දුට වඳිමි නමා කර

| ^ 1 2 | | ^ 1 | 2 | / 1 2 3 | ^ 1 2 | ^ 1 2 | / 1 2 3 |
|---|---|---|---|---|---|---|---|
| පැ | - | වි | ය | ග න - | දු - | රු - | - - - |
| දු | රැ | ර | දි | වා - - | ක - | ර - | - - - |
| ලී | - | ල | ය | රන් - - | පැ - | හැ - | - - - |
| සි | රි | ව | ස | ගෙ න - | ද - | ර - | - - - |
| මේ | - | ව | න | දුක් - - | දු - | ර - | - - - |
| ලන් | - | ට | පෙ | මා - - | ක - | ර - | - - - |
| සූ | - | රි | ය | දෙ ව් - | දු - | ට - | - - - |
| ව | දි | මි | න | මා - - | ක - | ර - | - - - |

**දෙසුළු මහා (මාත්‍රා 2 + 2 + 4) තුන්තිත තාලය**

උදාහරණ

| | ∧ 1 | 2 | ∧ 1 | 2 | / 1 | 2 | 3 | 4 | ∧ 1 | 2 | ∧ 1 | 2 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| උඩරට | කු | ඳ | ග | ත | ග | ත | දොම් | - | කු | ද | ග | ත | ග | ත | දොම් | - |
| පහතරට | රෙ | ගු | ඳ | ග | තත් | - | දොම් | - | රෙ | ගු | ඳ | ග | තත් | - | දොම් | - |
| සබරගමු | ජි | මි | ත | කු | දා | - | දොම් | - | ජි | මි | ත | කු | ඳා | - | දොම් | - |
| කවියක් | ව | ර | ල | ස | නිල් | - | පැ | හැ | යෙන් | - | - | - | ද | - | - | - |
| | අ | ඩ | ස | ඳ | ප | ටු | න | ල | ලින් | - | - | - | ද | - | - | - |
| | තු | න | ගු | ල් | බැ | ම | ස | ග | ලින් | - | - | - | ද | - | - | - |
| | ඉ | ඳු | නිල් | - | නෙත් | - | දෙ | කි | නා | - | - | - | ද | - | - | - |

**ඇගයීම**

1. තනි තිතේ ප්‍රභේද නම් කරන්න.
2. තුන් තිතේ ප්‍රභේද නම් කරන්න.
3. තුන් තිතට අයත් තාල සංකේත ලියා දක්වන්න.
4. තුන් තිතේ ප්‍රභේදයට අයත් බෙර පදයක් ප්‍රස්ථාර කරන්න.
5. තුන් තිතේ ප්‍රභේදයට අයත් කවියක් ප්‍රස්ථාර කරන්න.
6.

**පසුගිය වර්ෂවල විභාග ප්‍රශ්න**

**තුන් තිතේ තාල ප්‍රභේද**

2017

(01) තුන් තිතේ තාලයට අයත් (223) බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

2020

(02) මාත්‍රා 2+2+3 තාල රූපය හඳුන්වන්නේ ............................................ තිතේ ප්‍රභේදයක් ලෙසිනි.